**ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කර ගැනීමේ ව්‍යාපෘතිය - 2019**

---

ජාතික සම්ප්‍රේෂණ ජාලය උදෙසා පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කර ගැනීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා (ප්‍රංශ නියෝජිත ආයතනය) **Agence Francaise De Development** අතර 2015 ඔක්තෝබර් 02 දින එලඹි අංක සීඑල්කේ 101104 එල් දරණ ණය පහසුකම් ගිවිසුම සහ 2016 නොවැම්බර් 18 දින එලඹි අංක සීඑල්කේ 101104 එල් දරණ ණය පහසුකම් ගිවිසුමේ 3.4.3 (ඌ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. . පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

ව්‍යාපෘතියේ ණය පහසුකම් ගිවිසුම් අනුව, විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. පුනර්ජනනීය බලශක්තිය ජාලක අවශෝෂණ ධාරිතාව ඉහල නැංවීම සහ සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය අඩු කිරීම සහ පෞද්ගලික අංශයේ දායකත්වය සඳහා අවස්ථාව ලබාදීම මගින් ජාතික විදුලිබල පද්ධතියට පුනර්ජනනීය බලශක්තිය අවශෝෂණ කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ කටයුතු මාලිබොඩ, වේවැල්වත්ත, නාවලපිටිය, රාගල යන ප්‍රදේශවල කිලෝ වොට් 132/33 ක උප පොළවල් ඉදිකිරීම යන සංරචක 4 ක් යටතේ ක්‍රියාත්මක වේ. ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 6,660.10 කට සමාන එජඩො මිලියන 46.4 (යුරෝ මිලියන 41.10) වන අතර ඉන් රු. මිලියන 4,865.90 කට සමාන එජඩො මිලියන 33.9 (යුරෝ මිලියන 30) ක් මූල්‍යායනය කිරීමට (ප්‍රංශ නියෝජිත ආයතනය) Agence Francaise De Development එකඟ වී තිබුණු අතර උපකරණ සහ වැඩ සැපයීම් කොන්ත්‍රාත්තුවේ කොටසක් මුල්‍යානය කිරීමට භාවිතා කෙරේ. ඉතිරි මුදල වන රු.මිලියන 1,794.20 කට සමාන එජඩො මිලියන 5.3 (යූරෝ මිලියන 11.1) ක් මූල්‍යයනය කිරීමට ශ්‍රී ලංකා රජය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2016 අප්‍රේල් 01 දින ආරම්භ කරන ලද අතර 2019 ඔක්තෝබර් 30 දින වන විට තාක්ෂණිකව නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි  නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරන අඩුපාඩු

පහත සදහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | ගිණුම්කරන අඩුපාඩු | මුදල රු.මිලියන<br>කොන්ත්‍රාත්කරු | මුදල රු.මිලියන<br>මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගය | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| (අ) | LKAS 21 අනුව ව්‍යාපෘතිය විසින් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් සහ රදවා ගැනීමේ මුදල් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.එහි ප්‍රතිඵලයක් ලෙස පහත අගයන් නිරවුල් කිරීමෙන් පසු මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | **වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම්** | | වත්කම් වල සහ වගකීම්වල නියම වටිනාකම නොදැක්වේ. | සටහන් කර ගන්නා ලදී. | වර්ෂය අවසානයේදී අත්තිකාරම් සහ රදවා තබාගත් මුදල ප්‍රත්‍යාගණනය කල යුතුය. |
| | | B.E.S.T (යුරෝ) | (5,616,604.35) | | | |
| | | SIEMINS (යුරෝ) | 141,665.65 | | | |
| | | ABB | (1,044.15) | | | |
| | | Hengtoong | 15,639.31 | | | |
| | | Oplic Elct | 143,578.78 | | | |
| | | **රදවා තබාගත් මුදල්** | | | | |
| | | B.E.S.T (යුරෝ) | 810,521.28 | | | |
| | | ABB | (165,120.39 | | | |
| (ආ) | පහත සදහන් වියදම් අදාල වියදම් කාණ්ඩවලට හදුනා ගැනීමෙන් තොරව වැටුප් ලෙස හදුනාගෙන තිබුණි.<br><br>**හෙළිදරව් කර තිබුණු වියදම් කාණ්ඩය** / **ඇතුලත් කල යුතු වියදම් කාණ්ඩය**<br><br>කළමණාකරන මණ්ඩලයේ වැටුප් / කළමණාකරන මණ්ඩලයේ | | | කළමණාකරණ තීරණ ගැනීමේදී වියදම් කාණ්ඩයේ නියම බලපෑම නිරූපනය නොවේ. | සටහන් කර ගන්නා ලද අතර නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | වියදම් නිසි පරිදි වර්ගීකරණය කල යුතුය. |

| | |
|---|---|
| | දීමනා |
| අනෙකුත් කාර්යය මණ්ඩලයේ වැටුප් | අනෙකුත් කාර්යය මණ්ඩලයේ අතිකාල දීමනා වියදම් අනෙකුත් කාර්යය මණ්ඩලයේ දීමනා නිවාඩු දින වැටුප්, අනෙකුත් කාර්යය මණ්ඩලයේ ගිණුම් |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීතී,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | ---------------------- | ----------------- | --------- | ------------------------ | --------------- |
| (අ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ව්‍යාපෘතිය සමාලෝචිත කාලපරිච්ඡේදය තුලදී අදාල වැටුපෙන් අඩු කිරීමකින් තොරව උපයනවිට ගෙවීම් බදු රු.4,799,734ක් ව්‍යාපෘති අරමුදලින් ගෙවා තිබුණි. | අනවශ්‍ය ලෙස ව්‍යාපෘති පිරිවැය වැඩිවේ. | එහි සේවකයන් උපයන විට ගෙවීම් බදු වගකීමට යටත් නිසා ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින්ගේ උපයන විට ගෙවීම් බදු වගකීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් දරා ඇත. මේ පිළිබදව කිහිප වතාවක් විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය හා වැටුප් හා සේවක කොමිෂන් සභාව වෙත දැනුවත් කර ඇති අතර වෘත්තීය සමිති සමග සාකච්ඡාවක් පවත්වන ලදී. කෙසේවෙතත් එය නැවත සේවකයින් වෙත ආපසු හැරවීම පිළිබද සම්මුතියකට එළඹ නොතිබුණි. 2018-04-23 දිනැති අංක 2068/5 දරණ අතිවිශේෂ ගැසටය මගින් 2018-01-04 දින අත්සන් කරන ලද සම්මුතික ගිවිසුම ප්‍රසිද්ධ කර ඇත. එකගවූ | උපයන විට ගෙවීම් බදු සේවකයින්ගේ වැටුපෙන් අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කල යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | වැටුප් වෙනස්කිරීමට සම්මුතික ගිවිසුම කඩකිරීම ඇති අතර තව දුරටත් නීතිමය බලපෑමක් ඇතිකරයි. | |
| (ආ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජුලි 26 දිනැති අංක 05 දරණ කළමණාකරන විගණන චක්‍රලේඛය | ව්‍යාපෘතියේ ගණුදෙනු අභ්‍යන්තර විගණන අංශය මගින් විගණනය කර නොතිබුණි. | අභ්‍යන්තර පාලනය නිසිපරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. | ව්‍යාපෘතියේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය සහතික කර ගැනීමට ව්‍යාපෘතියේ ගණුදෙනු විගණනය කල යුතුය. |

### 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබදව භෞතික ප්‍රගතිය

- ව්‍යාපෘතියේ කටයුතු ආරම්භයේ සිට ණය මුදල යටතේ කරන ලද රු. මිලියන 4,865.95 කට සමාන එ.ජ.ඩො මිලියන 30 ක වෙන්කිරීමෙන් 2019 දෙසැම්බර් 31 දිනට සියයට 61.13ක් නියෝජනය කරන රු.මිලියන 3,666.40 කට සමාන එ.ජ.ඩො මිලියන 18.34ක් පමණක් උපයෝජනය කර තිබුණි.

- ගිවිසුමට අනුව ව්‍යාපෘතිය එහි කටයුතු 2016 අප්‍රේල් 01 දින ආරම්භ කරතිබුණු අතර 2019 ඔක්තෝබර් 31 දින වන විට තාක්ෂණිකව නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් අතිරේක සාමාන්‍ය කළමණාකරු කළමණාකරන මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමකින් තොරව ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය 2020 ඔක්තෝබර් 31 දින දක්වා දීර්ඝ කිරීමට අනුමත කර තිබුණි. තවද, ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2021 ජනවාරි 31 දක්වා කාලපරිච්ඡේදය දීර්ඝ කිරීම සදහා කරන ලද ඉල්ලීම සදහා (ප්‍රංශ නියෝජිත ආයතනය) **Agence Francaise De Development** විසින් දෙන ලද අනුමැතිය සම්බන්ධ සාක්ෂි විගණනයේදී ලබාගත නොහැකි විය.

- 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාව අනුව, ව්‍යාපෘතියේ අපේක්ෂිත භෞතික ප්‍රගතිය වූ සියයට 78 කට වඩා අඩුවෙන් සත්‍ය භෞතික ප්‍රගතිය සියයට 73ක මට්ටමක පැවතුණි.

### 3.2 මතභේදයට තුඩුදෙන ගැටළු

කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි 9 වගන්තිට අනුව ලංකා විදුලිබල මණ්ඩලය විසින් රේගු බදු ගෙවා තිබුනද, කොන්ත්‍රාත් බිල් මගින් මිළදී ගන්නා ලද වාහන 11ක් ලංකා විදුලිබල මණ්ඩලයේ නමින් ලියාපදිංචි කර නොතිබුණි.